**ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව - 2018**

**-------------------------------------------------------**

**1.1 මතය**

**------**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතේ 3(1) වගන්තිය | 2018 වර්ෂයේ මාස 5 කට ආසන්න කාලයක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. | සංස්ථාවේ හිටපු සභාපතිවරයාගේ ධූර කාලය අවසන් වීමෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ධූර කාලය අවසන් වීමෙන් අනතුරුව සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් නොකළ හෙයින් මෙම තත්ත්වය ඇතිවිය. එම බලතල සංස්ථාව සතු නොවන නිසා එවැනි තත්ත්වයන් සංස්ථාවේ පාලනයෙන් බැහැර වේ. | මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින් කඩිනම් පියවර ගතයුතු වේ. |
| (ආ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.2 හා 13.3 ජේදයන් | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවිකරණ හා කළමනාකරණ අලෙවිකරණ යන තනතුරු දෙකම 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වාම පුරප්පාඩුව පවතින බැවින් එම තනතුරු 02 වෙනුවෙන් දීර්ඝ කාලීන ලෙස වැඩ බැලීමට නිලධාරීන් පත්කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 18 දිනැති චක්‍රලේඛ අංක 03/2018 ප්‍රකාරව එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව බඳවා ගැනීම් කළ නොහැකි නිසා 2018 සැප්තැම්බර් 21 දිනැති ලිපියෙන් ඉල්ලා ඇති අනුමැතිය මෙතෙක් ලැබී නොමැති බැවින් බඳවා ගැනීම සිදුකළ නොහැකි වේ. | ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කලයුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි 2018 වර්ෂය තුළ සංස්ථාව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. 2019 වර්ෂය සඳහා 2019 ජුනි 30 දක්වාම රැස්වීම් පවත්වා නොතිබුණි. | වර්ෂය තුල රැස්වීම් 04 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොතිබීම නිසා රැස්වීම් පැවැත්විය නොහැකි විය. | අදාල විධිවිධාන පරිදි කටයුතු කිරීමට බලධාරීන් ක්‍රියා කල යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණ අතර සමස්ථ කාර්ය මණ්ඩලයේ නිශ්චිතව පැවතුණු වගකීම්වලට අදාලව පවතින නිපුණතා සහ රාජකාරි සාර්ථකත්වය සඳහා පැවතිය යුතු නිපුණතා අතර පරතරය හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එසේම නිපුණතා පරතරය අවම කිරිම සඳහා ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ද නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබුණු විගස අදාල තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකර චක්‍රලේඛයට අනුගතව කටයුතු සිදුකරමි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කලයුතු වේ. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 9.3 වගන්තිය | බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස් කිරීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | කාර්යය පවරා තිබූ හිටපු කළමනාකරු (පිරිස්) රැකියාවෙන් ඉවත්ව යාම නිසා නැවත බඳවා ගැනීම් සිදුකළ පසු මෙම කාර්යය ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත හැකිය. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 6.5.3 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2016 සහ 2017 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2019 ජුනි 30 දක්වාම සභාගත කර නොතිබුණි. | 2016 වර්ෂයේ වාර්තාව 2018.08.08 දින අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති නමුත් අවශ්‍ය ලියකියවිලි අමාත්‍යාංශයෙන් මේ දක්වා ලැබී නොමැත. 2017 වර්ෂයේ වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.309,088,327 ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පාඩුව රු.179,486,659 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.488,574,986 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව වියදම සියයට 74 කින් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු.139,677,455 කින් වැඩි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 68 ක් විය. විදේශ විනිමය ලාභය වැඩිවීම මෙම ආදායමෙහි වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. එසේම 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී මූල්‍ය වියදම රු.5,454,874 කින් හෙවත් සියයට 546 කින්ද වැඩිවී තිබුණ නමුත් ශුද්ධ වන්දි වියදම රු.472,182,189 කින් හෙවත් සියයට 87 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අභ්‍යන්තර පද්ධති අධ්‍යයනයක් සිදුකිරීම 2017 වර්ෂය අවසානය වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද එම කාර්යය 2019 ජුනි 30 දක්වා එම කටයුත්ත අවසන් කර නොතිබුණි. | SLIIT ආයතනයෙන් සහය ලබාගැනීමට අදහස් කළද එම ආයතනය මෙවැනි කටයුතු සිදු නොකරන බව දන්වා ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත ප්‍රසම්පාදන මහපෙන්වීම් අනුගමනය කර සුදුසු ආයතනයක් මේ සඳහා තෝරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | මූල්‍ය අංශයේ හා මෙහෙයුම් අංශයේ දත්ත සැසඳීමට ලක්කර නිවැරදිතාවය තහවුරු කර ගත හැකි ක්‍රම ස්ථාපිත කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාවේ මුළු ආදායමින් සියයට 87 ක් පමණ අපනයන ණය රක්ෂණ සහතික නිකුත් කිරීම තුළින් උපයන අතර 2017 වර්ෂයේ මුළු වාරික ආදායමට රු.58,988,550 ක හෙවත් සියයට 28 ක දායකත්වයක් ලබා දී තිබූ අපනයනකරුවකුගේ දායකත්වය 2018 වර්ෂයේදී අඩුවී තිබුණි. එසේම අපනයනකරුවන් 19 දෙනෙකු මුළු වාරික ආදායමට රු.142,666,310 ක් හෙවත් සියයට 69 ක දායකත්වයක් ලබා දී තිබුණි. එසේ වුවත් සංස්ථාවේ පැවැත්ම හා ඵලදායීතාවය වර්ධනය කරගැනීම උදෙසා මෙවැනි අපනයනකරුවන් දැනුවත්කිරීමේ කටයුතු ප්‍රචලිත කිරීමට හා ක්‍රමවත් කිරීමට අවශ්‍ය විධිමත් වැඩපිළිවෙලක් සංස්ථාව ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙහි සඳහන් අපනයනකරුගේ ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව 2018 දී අඩුවීමට බලපෑ හේතු සංස්ථාවේ පාලනයෙන් බැහැර වන අතර 2018 වර්ෂයේ තේ අපනයනය සමස්ථයක් ලෙස අඩුවීම හා අපනයනකරු විසින් ගෙවීම් කොන්දේසි වෙනස් කිරීම මේ සඳහා බලපා තිබුණි. | ආදායම් අඩුවීමට බලපෑ හේතු නිරාකරණයට අවශ්‍ය සුදුසු පියවර ගතයුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 56 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 34 ක් වූයෙන් එදිනට පුරප්පාඩු 22 ක් පැවතුණි. එම පුරප්පාඩු අතර විධායක මට්ටමේ පුරප්පාඩු 16 ක් ද විය. | | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වාර්තා මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 10 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොතිබීම නිසා සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ අත්සන් කළ මූල්‍ය ප්‍රකාශන 2019.02.28 දින ඉදිරිපත් කළ අතර අධ්‍යක්ෂ මණ්ඩලය පත්කල පසු අනුමැතිය සහිත වාර්තාව 2019 මැයි 10 දින අදාල උපලේඛන හා අනෙකුත් ලියකියවිලි සහිතව ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර අවසන්වරට 2010 වර්ෂය සඳහා වූ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. | 2019-2021 වර්ෂ 03 කට අදාල සංයුක්ත සැලැස්ම සකස් කිරිම සඳහා 2019 වර්ෂයේ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලසා ඇති අතර ඒ සඳහා අනුමැතිය 2019 මැයි ලැබී ඇත. ඒ අනුව සංයුක්ත සැලැස්ම 2019 වර්ෂය තුලදී සකස් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතේ 5 වන වගන්තියට අනුව සංස්ථාව කල යුතු කාර්යයන් ඉටුකර නොතිබුණි. | අපනයන සංවර්ධන කටයුතු වෙනුවෙන්ම සම්පත් යෙදවූ එම කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකරනු ලැබීම සඳහා පිහිටවූ ආයතනයක් බැවින් අපනයන ණය රක්ෂණ සංස්ථාව ඒ සඳහා කටයුතු කිරීම සම්පත් අපතේ යාමක් විය හැකිය. | සංස්ථාව ස්ථාපනය කිරීමේ අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා අවධානය යොමු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකිරීමට සැලසුම් කර තිබුණ කාර්යයන් 10 ක් ඉටු කර නොතිබුණි. | • නිෂ්පාදන විවිධාංගීකරණය හා සංවර්ධනය - අපනයනකරුවන්ගේ අවශ්‍යතා නිතර වෙනස්වන බැවින් දෛනිකව මෙම කටයුතු සිදුවේ.<br>• සංවර්ධන ව්‍යුහය හා රැකියා පිරිවිතර සංවර්ධනය - පුරප්පාඩු පිරවූ විගස ආරම්භ කිරීමට කටයුතු කරමි.<br>• කේන්ද්‍රීය සමූහ රැස්වීම් - සංවිධානය කල නමුත් අපනයනකරුවන් රැස්කිරීමේ අපහසුතා නිසා පැවැත්විය නොහැකි විය.<br>• දැනුවත් කිරීමේ වැඩසටහන් - සම්බන්ධීකරන ගැටළු නිසා පැවැත්විය නොහැකි විය.<br>• CPA නාම පුවරු සවිකිරීම - පිරිවැය ඉහල අගයක් ගැනීම නිසා සිදුකළ නොහැකි විය.<br>• වන්දි අත්පොත පිළියෙල කිරීම- සම්පූර්ණ කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිය යුතුව ඇත.<br>• පෙර හා පසු නැව්ගත කිරීම් අත්පොත - ආරම්භ කර නොමැත.<br>• ප්‍රතිරක්ෂණය කිරීම - සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලය නොමැතිවීම නිසා 2018 වර්ෂයේදී අනුමැතිය ලබාගත නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාල කාර්යයන් උපරිමයෙන් ළඟාකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කල යුතුය. |
| (iii) | 2018 වර්ෂය තුළදී මැණික් හා ස්වර්ණාභරණ කරුවන් සඳහා රැස්වීම් 12 ක් ද, විදේශ නියුක්තිසේවා කාර්යාංශයේ ලියාපදිංචි සංක්‍රමණික සේවකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 48 ක් ද, පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් මෙම වැඩසටහන් වලින් පිළිවෙලින් එක් වැඩසටහනක් හා වැඩසටහන් 05 ක් පමණක් 2018 වර්ෂය තුළදී පවත්වා තිබුණි. | 2018 වර්ෂයේ සභාපතිවරයෙකු නොමැතිවීම හා වෙනස්වීම මත සහභාගිවීමේ අවස්ථාව නොලැබීම හා සම්බන්ධීකරණ දුර්වලතා නිසා සැලසුම් කළ පරිදි රැස්වීම් සඳහා සහභාගිවීමට නොහැකි වූ අතර 2019 දී රැස්වීම් කීපයක් සඳහා සහභාගි වී ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාල කාර්යයන් උපරිමයෙන් ළඟාකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කල යුතුය. |

## 4.4 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන තනතුරක් නොමැති අතර පෞද්ගලික විගණන සමාගමක් මගින් අභ්‍යන්තර විගණනය සිදුකර තිබුණද 2018 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා 2019 ජුනි 30 දක්වාම ඉදිරිපත් කර නොතිබුණි. | සංස්ථාව පිරිවැය හා ප්‍රතිලාභ ගැන සැලකිලිමත්ව කටයුතු කරන බැවින් අභ්‍යන්තර විගණනය අඩු පිරිවැයකට වෘත්තීමය සුදුසුකම් ලත් සමාගමක් මගින් බාහිරව කර ගන්නා අතර වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නැත. 2018 සැප්තැම්බර් දක්වා අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර ඇත. | විගණන පනතට අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කලයුතු අතර අභ්‍යන්තර විගණන වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කල යුතුය. |

## 4.5 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් අතර අයිතම 34 ක සියයට 30 සිට සියයට 100 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | විශේෂයෙන්ම 2018 වර්ෂයේ සිදු වූ ලෝක ආර්ථික අර්බුදය ජාත්‍යන්තර වෙළඳාමට උග්‍ර බලපෑම් ඇති කළේය. මෙය සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සාමාන්‍ය තත්ත්වයක් යටතේ ගනු ලබන තීරණවලට වඩා දැඩි වූ තීරණ ගැනීමට බලපෑම් ඇති කළ අතර මහ භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් නොවන බැවින් ඇතැම් අලෙවි වියදම් දැරීම සුදුසු නොවන විටදී එම වියදම් දරා නොමැත. | අයවැය ලේඛනය හැකිතාක් නිවැරදිව සකස් කල යුතුය. |

## 4.6 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංස්ථාවේ සියළු අරමුණු තිරසාර සංවර්ධනයට අනුගත වුවත් සංස්ථාවට අදාල තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමට හා ඉලක්ක හා ඉලක්ක කරා ළඟාවීම් සන්ධිස්ථානයන්ද සැලසුම් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එ.ජා.වසර 2030 න්‍යාය පත්‍රයට අනුගතවීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කල යුතුවේ. |